**ශීර්ෂය - 235 නීති කොමිෂන් සභා දෙපාර්තමේන්තුව**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

ශීර්ෂය 235 - නීති කොමිෂන් සභා දෙපාර්තමේන්තුවේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව නීති කොමිෂන් සභා දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2023 මැයි 31 දින ගණන්දීමේ නිලධාරි වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2023 ජුනි 06 දින ගණන්දීමේ නිලධාරි වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2022 දෙසැම්බර් 31 දිනට නීති කොමිෂන් සභා දෙපාර්තමේන්තුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්ය සාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරිම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුව ද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මා විසින් කර තිබුණු නිර්දේශය ක්‍රියාත්මක කර තිබුණි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.6.1 මූල්‍ය ප්‍රකාශන චක්‍රලේඛ විධිවිධානවලට අනුකූල නොවීම

2022 දෙසැම්බර් 13 දිනැති අංක 2022/05 දරන රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කළ යුතුව තිබුණත්**,** එම අවශ්‍යතාවයන්ගෙන් බැහැර වූ අවස්ථා පහත දැක්වේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2022 දෙසැම්බර් 13 දිනැති රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක 2022/05 චක්‍රලේඛයේ මාර්ගෝපදේශ 7.4 අනුව මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශයේ (ඒසීඒ - එෆ්) "භාණ්ඩාගාරය වෙත ප්‍රේෂණ" යටතේ දක්වන අගයෙහි (අයිතම 'ඇ') වසර තුළ හා වසර අවසානයේ දී භාණ්ඩාගාරය වෙත කරන ලද ප්‍රේෂණ ඇතුළත් විය යුතු වුව ද**,** දෙපාර්තමේන්තු මුදල් පොත අනුව වසර තුළ සහ වසර අවසානයේ දී භාණ්ඩාගාරය වෙත කරන ලද ප්‍රේෂණවල එකතුව රු.1,827,015 ක් වුවත්, මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශයේ භාණ්ඩාගාරයට ප්‍රේෂණ රු.27,015 ක් ලෙස රු.1,800,000 ක් අඩුවෙන් දක්වා තිබුණි. | දෙපාර්තමේන්තුව වෙත 2022/05/05 වන දින රු.2,310,000 ක මුදලක් භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව විසින් තැන්පත් කර තිබුණු අතර පසුව එම දෙපාර්තමේන්තුවේ සහකාර අධ්‍යක්ෂකගෙන් වාචිකව විමසීමේදී දන්වා ඇත්තේ එය වැරදීමකින් දෙපාර්තමේන්තු ගිණුමට තැන්පත් වූවක් බැවින් එම මුදලින් රු. 1,800,000 ක් නැවත භාණ්ඩාගාරය වෙත තැන්පත් කර ඉතිරි රු. 510,000 ක මුදල දෙපාර්තමේන්තුවේ අක් මුදල් ලැබීම් වශයෙන් රඳවා තබා ගන්නා ලෙස දන්වා තිබුණි. | සිගාස් වැඩසටහනෙන් තොරතුරු ලබාගෙන මූල්‍ය ප්‍රකාශන නිවැරදිව සකස්කළ යුතු වේ. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට මූල්‍ය නොවන වත්කම් ශේෂය රු.26,540,210 ක් වුව ද, 2022 දෙසැම්බර් 13 දිනැති 2022/05 දරන රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශයේ 6 ඡේදය ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශ පිළියෙල කිරීමේ දී ඒසීඒ 6 - මූල්‍ය නොවන වත්කම් පිළිබඳ ප්‍රකාශය සඳහා SA 82 ආකෘතිය මූල්‍ය ප්‍රකාශනවලට අමුණා නොතිබුණි. | දෙපාර්තමේන්තුව සිගාස් වැඩසටහන භාවිත නොකරන බැවින් මූල්‍ය නොවන වත්කම් පිළිබඳ ආකෘතිය ඇමුණුම් ලෙස ඉදිරිපත් කළ නොහැකි බව දන්වා තිබුණි. | රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශය ප්‍රකාරව කටයුතු කළ යුතු ය. |

### 1.6.2 ගිණුම්කරණ අඩුපාඩු

#### (අ) ආදායම් නොවන ලැබීම්

මූල්‍ය ප්‍රකාශනවලට අදාළ ආදායම් නොවන ලැබීම් ගිණුම්ගත කිරීමේ දී පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (i) | භාණ්ඩාගාර අග්‍රිම ලැබීම්, භාණ්ඩාගාර මුද්‍රිත SA 70 අනුව රු.18,348,430 ක් වුව ද, එය මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශයේ රු.16,548,430 ක් ලෙස රු.1,800,000 ක් අඩුවෙන් ආදායම් නොවන ලැබීම් යටතේ දක්වා තිබුණි. | දෙපාර්තමේන්තුව වෙත 2022/05/05 වන දින රු.2,310,000 ක මුදලක් භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව විසින් තැන්පත් කර තිබුණු අතර පසුව එම දෙපාර්තමේන්තුවේ සහකාර අධ්‍යක්ෂකගෙන් වාචිකව විමසීමේදී දන්වා ඇත්තේ එය වැරදීමකින් දෙපාර්තමේන්තු ගිණුමට තැන්පත් වූවක් බැවින් එම මුදලින් රු. 1,800,000 ක් නැවත භාණ්ඩාගාරය වෙත තැන්පත් කර ඉතිරි රු. 510,000 ක මුදල දෙපාර්තමේන්තුවේ අක් මුදල් ලැබීම් වශයෙන් රඳවා තබා ගන්නා ලෙස දන්වා තිබුණි. | සිගාස් වැඩසටහනෙන් තොරතුරු ලබාගෙන මූල්‍ය ප්‍රකාශන නිවැරදිව සකස්කළ යුතු වේ. |
| (ii) | භාණ්ඩාගාර මුද්‍රිත SA 52 අනුව අත්තිකාරම් ගිණුම් ලැබීම් රු. 1,264,415 ක් වුව ද, එය මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශයේ රු.869,105ක් ලෙස රු.395,310 ක් අඩුවෙන් ආදායම් නොවන ලැබීම් යටතේ දක්වා තිබුණි. | අත්තිකාරම් ගිණුම් ලැබීම් මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශයේ ආදායම් නොවන ලැබීම් යටතේ රු.395,310 ක් අඩුවෙන් දක්වා ඇත්තේ දෙපාර්තමේන්තුව සිගාස් වැඩසටහන ක්‍රියාත්මක නොකරන බැවින් මූල්‍ය ප්‍රකාශ පිළියෙල කිරීමට අවශ්‍ය ශේෂ පිරික්සුම දෙපාර්තමේන්තුව සතුව නොතිබුණු නිසා රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂවරයෙකු සම්බන්ධ කරගන්නා ලද අතර එහිදී ලද උපදෙස් මත මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කරන ලද බව දන්වා තිබුණි. | සිගාස් වැඩසටහනෙන් තොරතුරු ලබාගෙන මූල්‍ය ප්‍රකාශන නිවැරදිව සකස්කළ යුතු වේ. |
| (iii) | මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ මෙහෙයුම් ක්‍රියාකාරම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන් යටතේ අග්‍රිම ලැබීම්, භාණ්ඩාගාර මුද්‍රිත SA 70 අනුව රු. 18,348,430 ක් වුව ද, රු.16,548,430 ක් ලෙස රු.1,800,000 ක් අඩුවෙන් දක්වා තිබුණි. | දෙපාර්තමේන්තුව වෙත 2022/05/05 වන දින රු.2,310,000 ක මුදලක් භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව විසින් තැන්පත් කර තිබුණු අතර පසුව එම දෙපාර්තමේන්තුවේ සහකාර අධ්‍යක්ෂකගෙන් වාචිකව විමසීමේදී දන්වා ඇත්තේ එය වැරදීමකින් | වාචික උපදෙස් මත නොව සිගාස් වැඩසටහනෙන් තොරතුරු ලබාගෙන මූල්‍ය ප්‍රකාශන නිවැරදිව සකස්කළ යුතු වේ. |

| | | |
|---|---|---|
| | දෙපාර්තමේන්තු ගිණුමට තැන්පත් වූවක් බැවින් එම මුදලින් රු.1,800,000 ක් නැවත භාණ්ඩාගාරය වෙත තැන්පත් කර ඉතිරි රු.510,000 ක මුදල දෙපාර්තමේන්තුවේ අක් මුදල් ලැබීම් වශයෙන් රඳවා තබා ගන්නා ලෙස දන්වා තිබුණි. | |

**(ආ) අත්තිකාරම් ගිණුම් ශේෂ**

අත්තිකාරම් ගිණුම්වල වර්ෂය අවසානයට වූ ශේෂ ගිණුම්ගත කිරීමේදී පහත සඳහන් අඩුපාඩුව අනාවරණය විය.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| භාණ්ඩාගාර මුද්‍රිත SA 52 අනුව අත්තිකාරම් ගෙවීම් රු.1,721,409 ක් වුව ද, එය මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශයේ රු. 2,116,719 ක් ලෙස රු.395,310 ක් වැඩියෙන් අත්තිකාරම් ගෙවීම් යටතේ දක්වා තිබුණි. | අත්තිකාරම් ගිණුම් ලැබීම් මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශයේ අත්තිකාරම් ගෙවීම් යටතේ රු.395,310 ක් වැඩියෙන් දක්වා ඇත්තේ දෙපාර්තමේන්තුව සිගාස් වැඩසටහන ක්‍රියාත්මක නොකරන බැවින් මූල්‍ය ප්‍රකාශ පිළියෙල කිරීමට අවශ්‍ය ශේෂ පිරික්සුම දෙපාර්තමේන්තුව සතුව නොතිබූ නිසා රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂවරයෙකු සම්බන්ධ කර ගෙන එහිදී ලද උපදෙස් මත මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කරන ලද බව දන්වා තිබුණි. | නිවැරදි වටිනාකම් මූල්‍ය ප්‍රකාශනවලට ඇතුළත් කිරීමට වගබලා ගත යුතු ය. |

**(ඇ) අග්‍රිම ශේෂය**

අග්‍රිම ශේෂය ගිණුම්ගත කිරීමේදී පහත සඳහන් අඩුපාඩු අනාවරණය විය.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (i) | මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන් හි මුදල් වැය කිරීම් යටතේ භාණ්ඩාගාරයට පියවන ලද අග්‍රිම දෙපාර්තමේන්තු මුදල් පොත අනුව රු.1,827,015 ක් වුවද, එය රු. 27,015 ක් ලෙස රු. 1,800,000 ක් අඩුවෙන් දක්වා තිබුණි. | දෙපාර්තමේන්තුව වෙත 2022/05/05 වන දින රු.2,310,000 ක මුදලක් භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව විසින් තැන්පත් කර තිබුණු අතර පසුව එම දෙපාර්තමේන්තුවේ සහකාර අධ්‍යක්ෂකගෙන් වාචිකව විමසීමේදී දන්වා ඇත්තේ එය වැරදීමකින් දෙපාර්තමේන්තු ගිණුමට තැන්පත් වූවක් බැවින් එම මුදලින් රු. 1,800,000 ක් නැවත භාණ්ඩාගාරය වෙත තැන්පත් කර ඉතිරි රු.510,000 ක මුදල | මූල්‍ය ප්‍රකාශනවලට නිවැරදි දත්ත ඇතුළත් කිරීමට වගබලා ගත යුතු වේ. |

| | | | |
|---|---|---|---|
| | | දෙපාර්තමේන්තුවේ අක් මුදල් ලැබීම් වශයෙන් රඳවා තබා ගන්නා ලෙස දන්වා තිබුණි. | |
| (ii) | අනෙකුත් ශීර්ෂ විසින් අත්තිකාරම් 'බී' ගිණුමට කරන ලද බැර කිරීම් භාණ්ඩාගාර මුද්‍රිත SA 51 අනුව රු.1,264,415 ක් වුව ද, රු. 869,105 ක් ලෙස රු. 395,310 ක් අඩුවෙන් අග්‍රිම සැසඳුම් ප්‍රකාශයේ දක්වා තිබුණි. | දෙපාර්තමේන්තුව සිගාස් වැඩසටහන ක්‍රියාත්මක නොකරන බැවින් මූල්‍ය ප්‍රකාශ පිළියෙල කිරීමට අවශ්‍ය ශේෂ පිරික්සුම දෙපාර්තමේන්තුව සතුව නොමැති බැවින් මූල්‍ය ප්‍රකාශ පිළියෙල කිරීමේදී ඇති වූ ගැටලුවලට පිළිතුරු ලබාගැනීම සඳහා රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂවරයෙකු සම්බන්ධ කර ගන්නා ලද අතර එහිදී ලද උපදෙස් පරිදි මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කරන ලද බවත් මෙම අත්තිකාරම් වාරික අග්‍රිම සැසඳුම් ප්‍රකාශයේ අනෙකුත් ශීර්ෂ විසින් අත්තිකාරම් "බී" ගිණුමට කරන ලද බැර කිරීම් යටතේ සඳහන් කරන ලෙසට ලද උපදෙස් පරිදි සඳහන් කරන ලද බවත් දන්වා තිබුණි. | මූල්‍ය ප්‍රකාශනවලට නිවැරදි දත්ත ඇතුළත් කිරීමට වගබලා ගත යුතු වේ. |
| (iii) | අනෙකුත් ශීර්ෂ විසින් අත්තිකාරම් 'බී' ගිණුමට කරන ලද හර කිරීම් භාණ්ඩාගාර මුද්‍රිත SA 51 අනුව රු.192,944 ක් වුව ද, රු. 588,254 ක් ලෙස රු. 395,310 ක් වැඩියෙන් අග්‍රිම සැසඳුම් ප්‍රකාශයේ දක්වා තිබුණි. | දෙපාර්තමේන්තුව සිගාස් වැඩසටහන ක්‍රියාත්මක නොකරන බැවින් මූල්‍ය ප්‍රකාශ පිළියෙල කිරීමට අවශ්‍ය ශේෂ පිරික්සුම දෙපාර්තමේන්තුව සතුව නොමැති බැවින් මූල්‍ය ප්‍රකාශ පිළියෙල කිරීමේදී ඇති වූ ගැටලුවලට පිළිතුරු ලබාගැනීම සඳහා රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂවරයෙකු සම්බන්ධ කර ගන්නා ලද අතර එහිදී ලද උපදෙස් පරිදි මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කරන ලද බවත් මෙම අත්තිකාරම් වාරික අග්‍රිම සැසඳුම් ප්‍රකාශයේ අනෙකුත් ශීර්ෂ විසින් අත්තිකාරම් "බී" ගිණුමට කරන ලද බැර කිරීම් යටතේ සඳහන් කරන ලෙසට ලද උපදෙස් පරිදි සඳහන් කරන ලද බවත් දන්වා තිබුණි. | මූල්‍ය ප්‍රකාශනවලට නිවැරදි දත්ත ඇතුළත් කිරීමට වගබලා ගත යුතු වේ. |

**(ඇ) ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම**

දෙපාර්තමේන්තුව විසින් පහත දැක්වෙන ඇතැම් ලේඛන පවත්වා නොතිබුණු අතර, ඇතැම් ලේඛන විධිමත්ව හා යාවත්කාලීනව පවත්වා නොතිබුණු බව නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| **හානි පිළිබඳ ලේඛනය**<br>මුදල් රෙගුලාසි 110 ප්‍රකාරව හානි පිළිබඳ ලේඛනයක් යාවත්කාලීන කර නොතිබුණි. | මෙම කාලවකවානුව තුළ කිසිදු අලාභ හානියක් වාර්තා නොවුනු බැවින් එම ලේඛනය යාවත්කාලීන කර නොමැති අතර මින් ඉදිරියට කිසියම් අලාභ හානියක් නොවුනහොත් අලාභයක් සිදු නොවූ බවට ලේඛනයේ සටහන් කිරීමට කටයුතු කරන බව දන්වා තිබුණි. | මුදල් රෙගුලාසි 110 හි විධිවිධාන ප්‍රකාර ඒ යටතේ වන ආකෘතිය අනුව හානි පිළිබඳ ලේඛනයක් පවත්වාගත යුතු වීම. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 වියදම් කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | මුදල් රෙගුලාසි 50 ප්‍රකාරව නිසි සැලකිල්ලෙන් හා සකසුරුවම්භාවයෙන් යුතුව ඇස්තමේන්තු පිළියෙල කළ යුතු වුවත්, පුනරාවර්තන වැය විෂයයන් 04 ක හා ප්‍රාග්ධන වැය විෂයයන් 01 ක එකතුව රු.662,509 ක් ඉතිරි වී තිබුණු අතර එය මුළු ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 69 සිට සියයට 100 දක්වා පරාසයක විහිදී තිබුණි. | පුනරාවර්තන හා ප්‍රාග්ධන වැය විෂයයන්හි ප්‍රතිපාදන සියයට 69 සිට සියයට 100 දක්වා ඉතිරිවන ලද්දේ කොවිඩ් වසංගතය හේතුවෙන් පැනවූ ඇදිරිනීතිය නිසා ආයතන වසා තැබීමත් අරගලය හේතුවෙන් හා ඉන්ධන අර්බුධය හේතුවෙන් කාලසටහනකට අනුව රාජකාරි කිරීමට පැමිණීමත් නිසාවෙන් සහ අයවැයෙන් ලද ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවීමත් ප්‍රතිපාදන වෙන්කර තිබුණද භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවෙන් ප්‍රතිපාදන නොලැබීමත් බව දන්වා තිබුණි. | සකසුරුවම්භාවයෙන් යුතුව ඇස්තමේන්තු පිළියෙල කළ යුතු වේ. |
| (ආ) | නොවැම්බර් හා දෙසැම්බර් මාසයන් වෙනුවෙන් 2022 දෙසැම්බර් 30 දින සභාපතිට ගෙවන ලද දීමනා වටිනාකම වන රු. 140,000 වැය විෂයය අංක 1003 - වෙනත් දීමනා යටතේ සටහන් නොකර වැය විෂයය 1001 - වැටුප් හා වේතන යටතේ සටහන් කර තිබුණි. | සභාපතිතුමාගේ දීමනා ගෙවීම සඳහා 1003 වැය විෂයයෙහි ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවූ බැවින් 1001 වැය විෂයයෙහි ප්‍රමාණවත් ප්‍රතිපාදන තිබූ හෙයින් වැටුප් සඳහා වූ 1001 වැය විෂයයෙන් එම මාස දෙකෙහි සභාපතිතුමාගේ දීමනාව ගෙවන ලද බව දන්වා තිබුණි. | මුදල් රෙගුලාසි 66 ප්‍රකාරව කටයුතු කළ යුතු ය. |

## 2.2 බැරකම් හා බැදීම්වලට එළඹීම

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2017 අප්‍රේල් 27 දිනැති රාජ්‍ය ගිණුම් චක්‍රලේඛ අංක 255/2017 දරන චක්‍රලේඛය ප්‍රකාරව පුද්ගල පඩිනඩි හා දීමනා හැර අනෙකුත් ගෙවීම් බැදීම් හා බැරකම් ලෙස හඳුනාගත යුතු වුව ද, රු. 18,945 ක අතිකාල දීමනා ගෙවීම් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට බැරකම් හා බැදීම් පිළිබඳ ප්‍රකාශයට ඇතුළත් කර තිබුණි. | වාර්තාවේ ඇති කරුණු සමඟ එකඟ වන බව දන්වා තිබුණි. | චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතු ය. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට 1402 වැය විෂයය යටතේ බැරකම් වටිනාකම රු. 797 ක් වැඩියෙන් මූල්‍ය ප්‍රකාශනයෙ හි බැරකම් ලේඛනය තුළ දක්වා තිබුණි. | බැරකම් ලේඛනයේ මොබිටෙල් ආයතනයට අදාළ බිල්පත් සටහන් කිරීමේදී රු.797 ක වෙනසක් සිදුවී ඇති බව දන්වා තිබුණි. | බැරකම් නිවැරදිව හඳුනාගෙන ගිණුම්ගත කළ යුතු ය. |

## 2.3 ප්‍රධාන ගණන්දීමේ නිලධාරී/ගණන්දීමේ නිලධාරී විසින් සිදු කළ යුතු සහතිකවීම්

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වන වගන්තියේ විධිවිධාන අනුව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී/ ගණන්දීමේ නිලධාරී විසින් පහත සඳහන් කරුණු සම්බන්ධයෙන් සහතික වීම් කළ යුතුව තිබුණත්, ඒ අනුව කටයුතු කර නොතිබුණි.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| දෙපාර්තමේන්තුව මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස්කර පවත්වාගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී හා ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර, එම පද්ධතියේ සඵලදායිතාවය පිළිබඳව කලින් කල සමාලෝචනය සිදුකර ඒ අනුව පද්ධති ඵලදායි ලෙස කරගෙන යෑමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතු බවත්, එම සමාලෝචනයන් ලිඛිතව සිදුකර එහි පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුව තිබුණත්, එවැනි සමාලෝචනයන් සිදුකළ බවට ප්‍රකාශ විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | මෙම දෙපාර්තමේන්තුවේ විගණන කටයුතු සිදු කරනු ලබන්නේ අධිකරණ අමාත්‍යාංශයේ අභ්‍යන්තර විගණන අංශය විසින් වන අතර මෙම දෙපාර්තමේන්තුව 2018 මුදල් වර්ෂය සඳහා පාර්ලිමේන්තු රාජ්‍ය ගිණුම් කාරක සභා කමිටුව කරන ලද සමාලෝචනයේදී සඵලදායී මූල්‍ය පාලනය හා අභ්‍යන්තර පාලන පද්ධතියක් සහිත රාජ්‍ය ආයතන අතරට තේරී පත් වූ බවත් එවැනි සමාලෝචනයක් 2018 වසරේ සිදු නොවීම ඊට හේතු විය හැකි බවත් දන්වා තිබුණි. | 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. |

## 2.4 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| | නීති,රීති හා රෙගුලාසි වලට යොමුව | නිරීක්ෂණය වටිනාකම රු. | අනුකූල නොවීම | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|---|
| (i) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය මුදල් රෙගුලාසි 135 | | මුදල් රෙගුලාසි ප්‍රකාරව මූල්‍ය බලතල පවරා තිබුණද, එමගින් වර්තමානයේ ආයතනයේ නොමැති තනතුරු සඳහා බලය පවරා දී තිබුණි. | උක්ත දෝෂය දෙපාර්තමේන්තුව විසින් නිරීක්ෂණය කරන ලද අතර 2023 මු.රෙ.135 බලය බෙදා හැරීම සංශෝධනය කරන ලද බව දන්වා තිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. |
| (ii) | රාජ්‍ය මුදල් චක්‍රලේඛය 2020 අගෝස්තු 28 දිනැති අංක 01/2020 දරන චක්‍රලේඛයේ 7 වගන්තිය | | චක්‍රලේඛය පරිදි දෙපාර්තමේන්තුවේ ඇතැම් නිලධාරින් පඩි සටහන්පත්‍ර අත්සන් තබා නොතිබුණි. | ඉදිරියේදී අත්සන් කිරීමට කටයුතු කරන බව දන්වා තිබුණි. | පඩි සටහන්පත්‍ර අත්සන් තැබිය යුතු වේ. |

**2.5 බැංකු ගිණුම් මෙහෙයවීම**

බැංකු ගිණුම් මෙහෙයවීම සම්බන්ධයෙන් සිදු කළ නියැදි විගණන පරීක්ෂාවේදී අනාවරණය වූ අඩුපාඩු පහත දැක්වේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට මුදල් පොත අනුව ශේෂය ශුන්‍ය වුවද, බැංකු සැසඳුම් ප්‍රකාශය පිළියෙල කිරීමේ දී මුදල් පොත අනුව එදිනට ශේෂය රු.27,015 ක් ලෙස දක්වා තිබුණි. | මෙම දෙපාර්තමේන්තුව වර්ෂ ගණනාවක සිට දෙසැම්බර් 31 දිනට අනුගමනය කරන පරිචය වන්නේ සියළුම සුළු අක් මුදල්වල ඉතිරි ප්‍රතිපාදන මුදල් පොතෙන් බැර කොට දෙසැම්බර් 31 දින දෙපාර්තමේන්තු බැංකු ගිණුමේ තැන්පත් කිරීම වන අතර ඒ අනුව මුදල් නොවූ චෙක්පත්වල වටිනාකමද අඩු කොට දෙපාර්තමේන්තුවේ ගිණුමෙහි ඉතිරිවන පාවිච්චියට නොගත් මුදල් නැවත භාණ්ඩාගාරය වෙත යවා නව වසරේ 01 වන දින බැංකුවෙන් හර නිවේදනයක් ලබා ගැනීමත් යම් මුදල් වර්ෂයක් අවසානයේ දෙපාර්තමේන්තුවෙන් පාවිච්චියට නොගත් ප්‍රතිපාදන දෙපාර්තමේන්තු ගිණුමෙහි අදාළ වර්ෂයේ දෙසැම්බර් 31 දිනත් පවතින බැවින් මුදල් පොත ශුන්‍ය ලෙස දෙසැම්බර් 31 දිනට දැක්වීම තථ්‍ය නොවන බැවින් ගිණුමෙහි පවත්නා ශේෂය සඳහන් කොට ඇති බවත්, මෙම පරිචය වර්ෂ ගණනාවක් පුරා ක්‍රියාත්මක වන බවත්, දන්වා තිබුණි. | නිවැරදි ශේෂයන් දක්වමින් සැසඳුම් ප්‍රකාශ පිළියෙල කිරීමට වගබලා ගත යුතු වේ. |
| (ආ) | ලංකා බැංකු ඉතිරිකිරීමේ ගිණුමට අදාළව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට බැංකු ප්‍රකාශය අනුව ශේෂය රු. 663,779 ක් වුව ද, බැංකු සැසඳුම් ප්‍රකාශය අනුව එම ශේෂය රු. 666,779 ක් ලෙස රු. 3,000 ක් වැඩියෙන් බැංකු සැසඳුම් ප්‍රකාශයේ දක්වා තිබුණි. | මෙම දෙපාර්තමේන්තුවට අදාළ බැංකු ගිණුමෙන් මුදල් ආපසු ගැනීමේදී රු.3,000 ක මුදලක් බැංකුව විසින් අහුරා තබා ගනු (hold) ලබන අතර එම මුදල මෙම බැංකු ප්‍රකාශනයේ අග ශේෂයට එකතු කොට සංශෝධනය කරන බව දන්වා තිබුණි. | බැංකු සැසඳුම් නිවැරදිව පිළියෙල කළ යුතු ය. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 සැලසුම් කිරීම

2020 අගෝස්තු 28 දිනැති අංක 02/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 03 ඡේදය ප්‍රකාරව වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම පිළියෙල කිරීමේදී හා එය ක්‍රියාත්මක කිරීමේදී පහත සඳහන් අඩුපාඩු අනාවරණය විය.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2020 අගෝස්තු 28 දිනැති අංක 02/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ සඳහන් ආකෘතිය ප්‍රකාරව අදාළ ක්‍රියාකාරකම් නිවැරදිව හඳුනා ගෙන 2022 වර්ෂය සඳහා වූ ක්‍රියාකාරී සැලැස්ම සකස්කර නොතිබුණි. | 2023 වර්ෂයේදී උක්ත චක්‍රලේඛය ප්‍රකාරව වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කරන ලද බව දන්වා තිබුණි. | ක්‍රියාකාරකම් නිවැරදිව හඳුනා ගෙන ක්‍රියාකාරී සැලැස්ම සකස්කළ යුතු ය. |
| (ආ) | 2021 අගෝස්තු 25 දිනැති මුදල් අමාත්‍යාංශ චක්‍රලේඛය (රාජ්‍ය වියදම් සමාලෝචනය) පරිදි මිලදීගැනීම් අත්හිටුවිය යුතු බව දක්වා තිබුණද, 2022 මාර්තු 29 දින NISACO ආයතනයෙන් පුස්තකාලය සඳහා රු.43,257 ක් වටිනා පොත් රාක්කයක් මිලටගෙන තිබුණි. ක්‍රියාකාරී සැලැස්මේ ස්ථාවර වත්කම් අත්පත් කරගැනීමට රු.මිලියන 0.40 ක් වෙන්කර තිබූ අතර, රු.43,257 ක මිලදීගැනීමක් පමණක් සිදුකර ක්‍රියාකාරී සැලැස්මේ ප්‍රගතිය ලෙස සියයට 87 ක මූල්‍ය කාර්ය සාධනයක් දක්වා තිබීම ගැටලු සහගත විය. | රජයේ භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව විසින් මෙම කාලවකවානුවේ ප්‍රාග්ධන වියදම් සඳහා මුදල් ලබාදීමේ හැකියාවක් නොමැති බව නියෝජ්‍ය අධ්‍යක්ෂ විසින් වාචිකව දන්වා තිබුණු අතර කොවිඩ් වසංගත තත්ත්වය හේතුවෙන් මූල්‍ය රෙගුලාසි ප්‍රකාරව ප්‍රසම්පාදන කටයුතු සිදු කිරීම සහ අනෙකුත් මිල කැඳවුම් ආදිය සිදුකිරීමද ප්‍රායෝගිකව දුෂ්කර වූ බවත්, එම කාර්තුවට වෙන්කොට තිබූ ප්‍රතිපාදනය වූයේ රු. 50,000 ක් බවත්, ප්‍රසම්පාදන සැලැස්මට අනුව මිලටගැනීමට අපේක්ෂා කළ භාණ්ඩවල මිල අධික ලෙස ඉහළ යාම මත එම ප්‍රතිපාදනය ඇතුළත පුස්තකාලය සඳහා පොත් රාක්කය මිලටගන්නා ලද බවත් දන්වා තිබුණි. | චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතු වීම හා ක්‍රියාකාරී සැලැස්මේ ප්‍රගතිය නිවැරදිව ගණනය කළ යුතු වේ. |

**3.2 අපේක්ෂිත නිමවුම් මට්ටම ලබා නොගැනීම**

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 1969 අංක 03 දරන නීති කොමිෂන් සභා පනතේ සඳහන් ප්‍රධාන අරමුණු නීති ප්‍රතිසංස්කරණය ප්‍රවර්ධනය කිරීම වන අතර, මෙම අරමුණු ඉටුකර ගැනීමට අදාළව කාර්යයන් 11 ක් හඳුනාගෙන තිබුණ ද, 2022 ජනවාරි 01 සිට 2022 දෙසැම්බර් 31 දින දක්වා නීති නිර්දේශ 04 ක් සඳහා රැස්වීම් වාර 06 ක් පවත්වා තිබුණු අතර සාකච්ඡා අවසන් කර ලද වාර්තා ගණන 01 ක් පමණක් වුවද, රැස්වීම් වාර 06 වෙනුවෙන් සභාපති ඇතුළුව කොමිෂන් සභා සාමාජිකයන් සඳහා ගෙවා තිබුණු දීමනාවල වටිනාකම රු.932,000 ක් වූ අතර ඒ අනුව රැස්වීම් වාරයක් වෙනුවෙන් දරන ලද වියදමෙහි සාමාන්‍ය රු.155,333 කි. | නීති කොමිෂන් සභාවේ කාර්ය සාධනය නැංවීමේ වැදගත්කම පිළිබඳව දෙපාර්තමේන්තු ප්‍රධානියා දැනුවත් කිරීමෙන් අනතුරුව අධිකරණ අමාත්‍යාංශ ලේකම්තුමා විසින් MOJ/IA/03/05(I)2021 අංක දරන 2021/09/22 දිනැති ලිපිය මගින් සභාපතිතුමා දැනුවත් කර තිබුණු අතර 2023/03/14 වන දින නීති කොමිෂන් සභා දෙපාර්තමේන්තු සභාපතිතුමාගේ ඉල්ලා අස්වීම මත නව සභාපතිවරයෙක් පත් කරන තෙක් නීති පර්යේෂණ කටයුතු තාවකාලිකව අත්හිටුවා ඇති බව දන්වා තිබුණි. | පරිපාලන ගැටළුව කඩිනමින් නිරාකරණය කර ප්‍රධාන අරමුණු ඉටුකර ගැනීමට කටයුතු කළ යුතු වේ. |

**3.3 වාර්ෂික කාර්යසාධන වාර්තාව**

2020 අගෝස්තු 28 දිනැති අංක 2/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 10.2 ඡේදය ප්‍රකාරව රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව විසින් නිකුත් කළ මාර්ගෝපදේශ අංක 14 හි සඳහන් ආකෘතිය ප්‍රකාරව වාර්ෂික කාර්ය සාධන වාර්තාව පිළියෙල කළ යුතුව තිබුණි. ඒ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2020 අගෝස්තු 28 දිනැති අංක 02/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 10.2 ඡේදය ප්‍රකාරව රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව විසින් නිකුත්කළ මාර්ගෝපදේශ අංක 14 හි සඳහන් ආකෘතිය ප්‍රකාරව සමාලෝචිත වර්ෂයේ වාර්ෂික ගිණුම් සමඟ වාර්ෂික කාර්ය සාධන වාර්තාවේ කෙටුම්පතක් ඉදිරිපත් කර නොතිබුණි. | වාර්තාවේ ඇති කරුණු සමඟ එකඟවන බවත්, ඉදිරියේදී එය සිදු කරන බවත් දන්වා තිබුණි. | චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. |

## 3.4 රජයේ නිලධාරීන් ඇප තැබීම

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මුදල් රෙගුලාසි 880 අනුව රජයේ ගිණුමට අදාළ වවුචර් සහතික කරන, චෙක්පත් අත්සන් කරන නිලධාරීන් රජයේ නිලධාරීන්ගේ ඇප ආඥා පනතට අනුකූලව ඇප තිබිය යුතු වුව ද, දෙපාර්තමේන්තුවේ චෙක්පත් සඳහා අත්සන් කරනු ලබන මාණ්ඩලික නිලධාරීන් දෙදෙනෙකු ඇප තබා නොතිබුණි. | මු.රෙ.880 (i) සහ 2011/01/11 දිනැති අංක 01/2011 සහ 2014/05/07 දිනැති අංක 01/2011(i) දරන අධිකරණ අමාත්‍යාංශ චක්‍රලේඛ ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ ඇප තැබිය යුතු සියලුම නිළධාරීන් වෙනුවෙන් ඇප තැබීමට කටයුතු සිදුකළ ද, සහකාර ලේකම් තනතුරු දරන නිලධාරීන් දෙදෙනෙකුගේ පමණක් ඇප තැන්පත් තබා නොමැති බවත්, එසේ ඇප තැබීම සඳහා අවශ්‍ය කටයුතු සම්පාදනය කොට දෙපාර්තමේන්තු විසින් SM/05/2016 හා 2016.09.20 දිනැති ලිපිවලින් අධිකරණ අමාත්‍යාංශය වෙත අවශ්‍ය ලිපි ලේඛන යොමුකොට ඇති අතර ඒ සඳහා අධිකරණ අමාත්‍යාංශය විසින් නීතිපති දෙපාර්තමේන්තුව වෙත යොමුකර ඇති බවත් දන්වා තිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. |

## 3.5 පාඩු හා හානි

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මුදල් රෙගුලාසි 110 ප්‍රකාරව ආයතනයේ සිදුවන සියළුම අලාභහානි වාර්තා තබා ගැනීමට හානි පිළිබඳ ලේඛනයක්, නඩත්තු කළ යුතු වුව ද, 2015 වර්ෂයේ සිට පවත්වාගෙන යනු ලබන හානි පිළිබඳ ලේඛනයේ 2019 නොවැම්බර් 04 දක්වා වූ වාහනවලින් සිදු වූ අලාභ පමණක් ඇතුළත් කර තිබුණි. | මෙම කාලවකවානුව තුළ කිසිදු අලාභ හානියක් වාර්තා නොවුනු බැවින් එම ලේඛණය යාවත්කාලීන කර නොමැති අතර මින් ඉදිරියට කිසියම් අලාභ හානියක් නොවුනහොත් අලාභයක් සිදු නොවූ බවට ලේඛණයේ සටහන් කිරීමට කටයුතු කරන බව දන්වමි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. |

## 3.6 කළමනාකරණ දූර්වලතා

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | අංක 03/2021 හා 2021 දෙසැම්බර් 11 දිනැති අයවැය චක්‍රලේඛය ප්‍රකාරව රාජ්‍ය ආයතනවල දුරකථන වියදම සියයට 25 කින් අඩුකිරීම සඳහා අවශ්‍ය කටයුතු කිරීම, විදුලිබල වියදම සියයට 10 කින් අඩුකිරීම සඳහා ක්‍රමවේද සකස් කිරීම කළ යුතු වුව ද, එවැනි ක්‍රමවේදයක් සකස්කර නොතිබුණි. | ලේකම් තනතුරේ වැඩබලන නිලධාරිනියට වැඩබැලීමේ තනතුරට හිමිකම් තිබුණ ද එම දීමනාව ලබා නොගන්නා අතර ඇය ද සිය නිත්‍ය තනතුරට හිමි සංචිත ප්‍රමාණය පමණක් ලබාගන්නා අතර වියදම් සීමා කිරීමේ චක්‍රලේඛනය පැමිණි පසු එයට ගත් පියවරක් ලෙස ඒ වන විට සංචිත රාජකාරියේ යොදවා තිබූ සංචිත රථ 02 වෙනුවට මාණ්ඩලික නිලධාරීන් තිදෙනාම එක් සංචිත රථයකින් රාජකාරි ප්‍රවාහනය ලබාගන්නා බව දන්වා තිබුණි. | චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. |
| (ආ) | 2021 වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් හඳුනාගත් වෙන්දේසි කිරීමට නියමිත වාහන අමතර කොටස් සමාලෝචිත වර්ෂයේ 2022 දෙසැම්බර් 31 දින වන විටත් වෙන්දේසි කිරීමට කටයුතු කර නොතිබුණි. | 2021 භාණ්ඩ සමීක්ෂණයෙන් හඳුනාගත් වාහන අමතර කොටස් සහ අනෙක් භාණ්ඩ 2023/04/04 දින වෙන්දේසි කොට ඉවත් කරන ලද බව දන්වා තිබුණි. | හඳුනාගත් වාහන අමතර කොටස් වෙන්දේසි කර ගිණුම්වලින් ඉවත් කිරීමට කටයුතු කළ යුතු ය. |

## 4. යහපාලනය

### 4.1 අභ්‍යන්තර විගණනය

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 40 (1) වගන්තියේ විධිවිධාන ප්‍රකාරව අභ්‍යන්තර විගණනය සිදුකළ යුතු වුව ද, 2022 වර්ෂය සඳහා අධිකරණ අමාත්‍යාංශයෙන් හෝ අභ්‍යන්තර විගණනයක් සිදුකර නොතිබුණි. | දෙපාර්තමේන්තුවේ අභ්‍යන්තර විගණනය අධිකරණ අමාත්‍යාංශයේ අභ්‍යන්තර විගණන අංශය විසින් සිදු කරනු ලබන අතර, 2021 වසරේ පැවති කොවිඩ් තත්ත්වය හේතුවෙන් එම වසරේ අභ්‍යන්තර විගණනය සිදු කිරීමට අමාත්‍යංශයේ අභ්‍යන්තර විගණන අංශය කටයුතු නොකිරීමට හේතු සාධක වන්නට ඇතැයි අපේක්ෂා කරන බවත් අභ්‍යන්තර විගණනය පැවැත්වීම දෙපාර්තමේන්තුවේ විෂයය පථයෙන් බැහැර කාර්යයක් බවත් දන්වා තිබුණි. | පනතේ විධිවිධාන ප්‍රකාරව අභ්‍යන්තර විගණනය සිදුකළ යුතු ය. |

## 5. මානව සම්පත් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2018 ජනවාරි 24 දිනැති අංක 02/2018 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය ප්‍රකාරව ආයතනයේ සේවයේ නියුතු සමස්ත කාර්ය මණ්ඩලය සඳහා වාර්ෂික කාර්ය සාධන ගිවිසුම් අත්සන් කර නොතිබුණි. | විගණනය විසින් ඉදිරිපත් කොට ඇති නිරීක්ෂණයට අනුකූලව ඉදිරියේදී කටයුතු කරන දන්වා තිබුණි. | චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. |
| (ආ) | ආයතනයේ කාර්ය මණ්ඩලයේ අනුමත නිලධාරීන් සංඛ්‍යාව 29 ක් වූ නමුත් 2022 දෙසැම්බර් 31 දිනට තථ්‍ය කාර්ය මණ්ඩලයේ ජ්‍යෙෂ්ඨ මට්ටමේ පුරප්පාඩු 03 ක් ද්විතීය මට්ටමේ පුරප්පාඩු 07 ක් හා ප්‍රාථමික මට්ටමේ පුරප්පාඩු 02 ක් වශයෙන් සමස්ත කාර්ය මණ්ඩලය පුරප්පාඩු සංඛ්‍යාව 12 ක් විය. | වර්තමානයෙහි දී ලේකම් තනතුරෙහි පූර්ණ කාලීන රාජකාරී ඉටු කිරීම වැඩ බලන ලේකම් විසින් සිදු කරනු ලබන බවත්, නියෝජ්‍ය ලේකම් තනතුර 2022.02.02 න් පසුව උසස්වීම් පදනම් මත පුරප්පාඩුව ඉවත් වන අතර දැනට සංවර්ධන නිලධාරීන්ගේ පුරප්පාඩු පූර්ණ ලෙස සපුරා ඇති බවත්, කළමනාකරණ සේවා නිලධාරීන් සංඛ්‍යාව දැනට ප්‍රමාණවත් බවත්, රියදුරු තනතුරෙහි පුරප්පාඩුව සඳහා බහුකාර්ය දෙපාර්තමේන්තුවේ පුහුණුවන රියදුරු මහතෙකු සේවයේ යොදවා ඇති බවත් දන්වා තිබුණි. | පුරප්පාඩු සම්පූර්ණ කර ගැනීමට කටයුතු කළ යුතු වේ. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ II පරිච්ඡේදයේ 13.3 වගන්තිය ප්‍රකාරව වැඩ බැලීමේ පත්වීමක් සිදුකළ යුත්තේ නිත්‍ය පත්වීමක් කරන තෙක් තාවකාලික ප්‍රතිකර්මයක් ලෙස වුව ද, 2014 වර්ෂයේ සිට පුරප්පාඩුව පවතින ලේකම් තනතුරට විගණිත දින දක්වාම නිත්‍ය පත්වීමක් සිදුකර නොතිබුණි. | මෙම දෙපාර්තමේන්තුවේ ලේකම් තනතුරෙහි පුරප්පාඩු පිරවීමට අධිකරණ අමාත්‍යාංශය විසින් උත්සහ කළද එයට අවශ්‍ය වන වෘත්තීය සුදුසුකම් සහ වෘත්තීය සේවා කාලය සපිරූ සුදුසු අයදුම්කරුවන් ඉදිරිපත් නොවීම මත එම පුරප්පාඩුව පිරවීමට නොහැකි වී ඇති අතර එම තනතුරට බලාපොරොත්තු වන වෘත්තීය සුදුසුකම් සහ සේවා පළපුරුද්දට අවශ්‍ය වර්ෂ ගණන සැපිරූ අයවලුන් එම තනතුරට අදාළ වන රජයේ වැටුප් පරිමාණය මත අයදුම් නොකිරීමද මෙයට හේතු වී ඇති බව දන්වා තිබුණි. | පුරප්පාඩු ස්ථිර පදනමින් සම්පූර්ණ කර ගැනීමට කටයුතු කළ යුතු වේ. |